# ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ මෑත කාලීන නිෂ්පාදන පිරිවැයේ හැසිරීම.

ඩබ්. ඒ. ඩී. ටී. එස්. මානපුරාව[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ අපනයන සංයුතියේ තේ කර්මාන්තය ආශ්‍රිත ව කරනු ලබන නිෂ්පාදනයන් දෙවන වනුයේ, ඇඟළුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනයන්ට පමණක් වන බැවින්, තේ කර්මාන්තය මෙරට ආර්ථිකයට විශාල දායකත්වයක් සපයනු ලබන සුවිශේෂී කර්මාන්තයක් වේ. නමුත්, මෑත කාලය තුළ මෙම කර්මාන්තය ඉතා සෙමින් වර්ධනය වන අතර, වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 222,000 පමණ ස්ථාවරව පවතින බවත්, මෑත වසර 10 ක කාලය තුළ සාමාන්‍යයෙන් වර්ෂයකට 3.53% පමණ දළ දේශීය නිෂ්පාදනයෙන් අඩු වී ඇති අතර දේශීය වෙළඳපළ මිල ගණන් ද 13.07% කින් අපනයන වෙළඳපල මිල 9.39% ද වැඩි වී ඇති බවයි. ඒ අනුව මෙම කර්මාන්තය කෙරෙහි අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැකි වූයේ, මෙම කර්මාන්තය වර්ෂයකට 8.5% පමණ පිරිවැයේ වැඩිවීමේ ගැටලුවකට මුහුණ දෙමින් පවතින බවයි. ඒ අනුව 2000-2015 කාල සීමාව තුළ තේ කර්මාන්තයේ පිරිවැය ඉහළ යාමට බලපාන ලද හේතු අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. ඒ සඳහා 2000-2015 දක්වා මහ බැංකු වාර්තා උපයෝගී කොට ගනිමින් ද්විතීයික දත්ත එක්රැස් කර ගත් අතර කාල ශ්‍රේණි විශ්ලේෂණය හා කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් යොදා ගෙන විශ්ලේෂණය කරනු ලැබීය. ඒ අනුව පිරිවැය වැඩි වීමට වැඩි වශයෙන්ම බලපා ඇත්තේ, වර්ෂයක් පාසා ශ්‍රමික වැටුප් අඛණ්ඩව ඉතා වේගයෙන් වැඩි වීමත්, පොහොර භාවිතය සීඝ්‍රයෙන් වැඩි වීම මේ සඳහා බලපා ඇති බවත් ය. ඒ අනුව විවිධ රජයන් විවිධ පියවර ගෙන ඇති අතර, ඒ අනුව කුඩා වතු හිමියන්ට ලබාදෙන පොහොර සහනාධාරය එයින් ප්‍රධාන තැනක් ගනී. නමුත් එය මෙම කර්මාන්තයේ ප්‍රගමනයට විශාල දායකත්වයක් ලබා නොදී ඇති අතර, ඒ සඳහා වඩාත් කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ලබාදීම විවිධ පර්යේෂණ සිදු කොට හඳුන්වා දීම වැනි ක්‍රියාමාර්ග තුළින් මෙම කර්මාන්තයේ වර්ධනයට විශාල දායකත්වයක් ලබාගෙන ඇති බවත් ය.

**මුඛ්‍ය පද** : පිරිවැය, තේ කර්මාන්තය, ආර්ථික

[1] ආර්ථික විද්‍යා අධ්‍යයනය අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
thilinishankani1993@gmail.com